සන්නස
SANNASA

# සෞන්දර්යය අධ්‍යාපනයට තෝතැන්නක් වූ, හොරණ ශ්‍රීපාලියේ, 'උපාසනය'



උදයරත්න වීරසේකර



අධ්‍යාපනයේ පරමාදර්ශී මුලිකාංග වශයෙන්, ඉගෙනුම ලබන ශිෂ්‍යයා තුළ දැනුම, කුසලතා සහ ආකල්ප (knowledge" skills and attitudes) යන ත්‍රිත්වය සංවර්ධනය සිදුවිය යුතු බව සම්මත පිළිගැනීමකි. එහෙත් මෑතකදී සිට නව තාක්ෂණ මෙවලම්ද අධ්‍යාපන ක්ෂේත්‍රයට ශීඝ්‍රයෙන් සම්බන්ධ වීම නිසා මහත් පෙරළියක් සිදු වෙමින් පවතින බැවින්, නිර්මාණශිලිත්වය (creativity) නමින් නව අංගයක්ද එයට එකතු වී, මුලිකාංග චතුර්තයක් ලෙස පිළිගතයුතු බව සාධාරණීකරණය වී තිබේ.

එහෙත්, එකිනෙකා පරයා යමින්, දුවන්නන් වාලේ දුවන සමාජයක ඉහත දැක්වූ අධ්‍යාපන සිද්ධාන්ත වලට පටහැනි බොහෝ දේවල්, ඊනියා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළම විද්‍යාමාන වෙමින් පවතී. දරුවන් තුළ කුසලතා, සහ ආකල්ප වර්ධනය කිරීමේ අධ්‍යාපනයක් වෙනුවට දැනුම ලබාදීමට පමණක් සීමා වී ඇතැයි සිතිය හැකි, පාසැලෙන් බාහිර ස්ථාන වලින් ලබන අධ්‍යාපනය මගින් දරුවන් යාන්ත්‍රික ඒකක බවට පත්වෙමින් සිටීම අභාග්‍යයකි.

මෙවන් පසුබිමක් යටතේ වුවද, දිවයිනේ ප්‍රසිද්ධ ජාතික පාසැලක් වන, හොරණ ශ්‍රීපාලි විද්‍යාලයයේ, සම්ප්‍රදායට මුල් තැන දී දේශීයත්වය පෙරදැරි කර ගනිමින් පවත්වා ගෙනයනු ලබන, ඉතාමත් චමත්කාරජනක 'උපාසනයී ඕනෑම කෙනෙකුගේ සිත් ඇදගන්නාසුළු සංදර්ශනයකි.

'උපාසනය' යන මෙම සුවිශේෂී නමින් හැඳින්වෙනුයේ, සතියකට වරක් ශ්‍රීපාලි විද්‍යාලයයේ පවත්වනු ලබන උදය රැස්වීමයි.

ශ්‍රීපාලි විදුහලට දීප්තිමත් අතීතයක් තිබේ. එහි නිර්මාතෘ වරයා, හොරණ පදිංචිව සිටි ප්‍රභූවරයෙකු, දේශපාලනඥයෙකු, මානව හිතවාදියෙකු මෙන්ම අධ්‍යාපනඥයෙකු වූ, දිවංගත විල්මට්. ඒ. පෙරේරා මැතිතුමාය.

භාරතයේ මහාකවි, ගුරුදේව් රබීන්ද්‍රනාත් තාගෝර් මැතිතුමා විසින් ආරම්භ කරනලද අද්විතීය සෞන්දර්ය අධ්‍යාපන ආයතනයක්, වූ ශාන්ති නිකේතනයට ගිය එතුමාට, ඒ මාදිලියේ අධ්‍යාපන ආයතනයක් ශ්‍රී ලංකාවේද පිහිටුවිය යුතු බවට අදහසක් පහලවී තිබේ. ශාන්ති නිකේතනයේ නිර්මාතෘ වන තාගෝර් මැතිතුමා බෙංගාලි භාෂාවෙන්, සාහිත්‍ය පෝෂණයට ඉමහත් සේවයක් කරන ලද පඬිවරයෙකි. එතුමා විසින් රචනා කරනලද 'ගීතාංජලී' නම් කාව්‍ය සංග්‍රහය ලොව අග්‍ර ගණයේ සාහිත්‍ය නිර්මාණයක් ලෙස පිළිගැනිණ.



ගුරුදේව්, රබීන්ද්‍රනාත් තාගෝර් මැතිතුමා

කතුවරයා විසින්ම ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද 'ගීතාංජලී' කාව්‍යය සඳහා, 1913 වර්ෂයේදී, සාහිත්‍යය පිළිබඳ 'නොබෙල්' ත්‍යාගයද හිමි වී තිබේ. එතුමාගේ ආභාෂය ලැබූ විල්මට්. ඒ. පෙරේරා මැතිතුමා ආපසු මවු බිමට පැමිණි විගසම, භාරතයේ ශාන්ති නිකේතනයට අනුරූප සෞන්දර්යය ආයතනයක් ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීම සඳහා, හොරණ නගරයේ කුඩා කඳු ගැටයක් ආශ්‍රිතව පිහිටි තමන්ට අයිති රමණීය භූමි භාගය තෝරා ගත්තේය.

1934 වර්ෂයේදී, භාරතයේ මහාකවි ගුරු දේව් රබින්ද්‍රනාත් තාගෝර් පඬිවරයා ශ්‍රී ලංකාවට සැපත් විය.



විල්මට් ඒ පෙරේරා මැතිතුමා විසින්, ශ්‍රීපාලී පරිශ්‍රයට පැමිණි, තාගෝර් මැතිතුමා සාදරයෙන් පිළිගැනීම (1934 වසරේදී)

විල්මට්. ඒ. පෙරේරා මැතිතුමාගේ ආරාධනය පරිදි, හොරණට පැමිණි එතුමා, යෝජිත අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා මුල්ගල තබා, සිහිවටනයක් ලෙස සියඹලා පැලයක්ද රෝපණය කරන ලදී. පසුව එම ප්‍රධාන ගොඩනැගිල්ල 'නිර්මාණී' ලෙස නම්කර තිබේ.

එදිනම සිසුන් හය දෙනෙකු ඇතුලත්කර ගැනීමෙන් විදුහල ආරම්භ කර, එතුමා විසින්ම, විදුහලට තබා ඇති 'ශ්‍රීපාලි' යන නම, බෙංගාලි භාෂාවෙන් 'චමත්කාරය රජයන දෙවොල' යන අරුත ගෙනදේ.

මහා කවියෙකු මෙන්ම සෞන්දර්යය රසාස්වාදකයෙකුද වූ රබින්ද්‍රනාත් තාගෝර් වියතාණන් විසින් නිර්මාණය කරන ලද, භාරත ශාන්ති නිකේතනයේ ආකෘතිය අනුව ශ්‍රීපාලි විදුහල ගොඩනැගීම ආදී කර්තෘවරයාගේ අභිප්‍රාය විය. ශ්‍රීපාලියේ උදය රැස්වීම වන 'උපාසනය' අනිකුත් බොහෝ විදුහල්වල උදය රැස්වීම් වලට වඩා වෙනස් ස්වරූපයක් ගනී. උදය රැස්වීමට 'උපාසනය' යන නම යෝජනා කර තිබෙනුයේ තාගෝර් තුමා විසින්ය. සංස්කෘත භාෂාවෙන් මෙයට 'බැතියෙන් පිදුම' වැනි අර්ථයක් ගෙන දේ. දරුවන්ගේ නැණ නුවණ වඩවන විදුහලක උදය රැස්වීම එවැනි හරවත් නමකින් හැඳින්වීම කෙතරම් අගේද? ප්‍රධාන රැස්වීම් ශාලාවක් තිබියදීත් සතියකට වරක්, විදුහල් භූමිය මධ්‍යයේ පිහිටි 'උපාසන මළුවේ' පැවැත්වෙන උපාසනය ඉතාමත් විචිත්‍ර සංදර්ශනයකි. උපාසනය පැවැත්වෙන, සුදු වැලි ඇතුරූ විශේෂ භූමි භාගය 'උපාසන මළුව' වේ. උපාසන මළුවේ ඉදිරියෙන්ම ඇත්තේ කුඩා වේදිකාවක් වන 'උපාසන පීඨිකාවයි'.



උපාසන පීඨිකාව

එදා, තාගෝර් තුමා විසින් රෝපණය කරන ලද, සියඹලාව අද වයෝවෘද්ධ රූස්ස ගසකි. උපාසන මළුව, එම සියඹලා ගස දක්වා විහිදී යයි. උපාසන මළුව වටා සහ විදුහල් බිමේ තවත් ස්ථාන කිහිපයකම, අප්‍රියෙල් මැයි මාසවලදී මුළු ගසම රෝස පැහැති මලින් බරවන Tabebuia rosea ශාක සමුහයක් තිබේ. විදේශීය ශාකයක් වන මෙය 'රොබොරෝසියා' යන අන්වර්ථ නාමයකින් හැඳින්වීමට ශ්‍රී පාලියේ කවුරුත් පුරුදුව සිටිති.



උපාසනය සඳහා සිසු සිසුවියෝ පෙළ ගැසෙති

උපාසන මළුව වටා ඇති 'රොබොරෝසියා' ගස් මලින් බරවී තිබෙන මැයි මාසයේදී ගස් යට වැටෙන මල් වලින් තවත් විශ්මිත දේ කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවෝ පෙළඹෙති.

උපාසන දිනයේ උදෙන්ම පාසලට පැමිණෙන ඔව්හු බිම වැටී ඇති 'රොබොරෝසියා' මල් අහුලා, ඒවායින් උපාසන මළුව බෑවුමේ සිත් ඇදගන්නාසුලු නිර්මාණ සකස් කරති. එසේ කරන ලද එක් නිර්මාණයක ඡායාරූපයක් පහත දැක්වේ.



රෝබොරෝසියා මල් වලින් නිමවූ 'ශ්‍රීපාලි' නම

12 වන පිටට